# ඔස්ට්‍රේලියාවේ සිංහල හඬ - එස්බීඑස් සිංහල සේවය

**SBS ගුවන් විදුලියේ නව සිංහල සේවය සැමගේ ප්‍රසාදය සමගින් පළමු දිනුම් කණුව මැයි 13 වෙනිදා පසු කරයි.**



**SBS ගුවන් විදුලි නාලිකාව ශ්‍රී ලාංකික ප්‍රජාවටම තිබෙන විශාල සම්පතක් කිවොත් නිවැරදියි. කොපමණ ගුවන් විදුලි නාලිකා තිබුණත් සමස්ථ ඕස්ට්‍රේලියාවටම ඇහෙන ගුවන් විදුලි නාලිකාව තමයි SBS ගුවන් විදුලි නාලිකාව. 2013 වසර දක්වා පැයකට සීමාවී තිබුන සිංහල සේවයේ ගුවන් කාලය දැන් පැය හතර දක්වා දීර්ඝ කර තිබෙනවා. එය අපි ලැබූ ජයග්‍රහනයක් ලෙස අපට පෙනෙනවා. භාෂා විශාල සංඛ්‍යාවක් කතා කරන පිරිසක් ජීවත් වන ඕස්ට්‍රේලියාව වැනි රටක භාෂා විශාල සංඛ්‍යාවකින් ඉදිරිපත් කරන ගුවන් විදුලි වැඩසටහන් අතරට අපේ සිංහල භාෂාවට පැය 4-6 ක කාලයක් ලැබීම විශේෂ වු කාරණාවක්. සෑම බදාද, බ්‍රහස්පතින්දා,සිකුරාදා දහවල් 11-12 දක්වා මේ වැඩසටහන ඔබට සවන් දිය හැකියි.**

**මේ සියළු කාර්යයන් පිටු පස සිටින අත්දැකිම් ඇති මාධ්‍යවේදිනියක් තමයි දිනේෂා දිල්රුක්ෂි විජේසූරිය. එස්බීඑස් සිංහල සේවයේ විධායක නිෂ්පාදකවරිය ඇයයි.. ඇය මාධ්‍ය ක්ෂේත්‍රයේ ඉතා විශාල අත්දැකීම් රාශියක් තිබෙන දක්ෂ ශිල්පි නියෙක ලෙස හඳුන්වා දීමට මම කැමතියි. පාසල් කාලයේ සිටම ගුවන් විදුලියට ළමා මණ්ඩලයෙන් සහභාගි වු ඇය සිරස රූපවාහිනි සහ ගුවන්විදුලි නාලිකාවට සම්බන්ධ වෙමින් ලක්හඬ ගුවන් විදුලිය ආරම්භයේ දී එයට සම්බන්ධ වෙමින් එහි සේවය කරමින් විවිධ වැඩ සටහන් අධ්‍යක්ෂනය කරමින් නිෂ්පාදනය කරමින් වසර ගණනක් මාධ්‍ය ක්ෂේත්‍රයේ රැඳී සිටි ශිල්පි නියක්....**

**එස්බීඑස් සිංහල සේවයේ නව පරිවර්තනයෙන් පසු ගෙවුණ වසර පිළිබඳ ඇය හා සංවාදයක යෙදෙන්නටයි සන්නසේ මේ උත්සාහය.**

**ශ්‍රීනාත් -**
අපිට කියන්න SBS ගුවන් විදුලිය දැන් විකාශන තත්වය පවත්වාගෙන යන්නේ කොහොමද?

**දිල්රුක්ෂි**
දැන් හරියටම මැයි මාසේ 13 වෙනිදාට අලුත් කාල වෙලාවල් එක්ක අලුත් ආකාරයකට පටන් අරගෙන වසරක් වෙනවා. මෙතෙක් කල් තිබුනේ ඉරිදා දහවල් 1 සිට 2 දක්වා නමුත් දැන් මේ විකාශන කාලය වෙනස් වුනා. වෙනස් වෙන්න මුලික වු කාරණය තමයි 2014 වසරේ පැවැත්වුනු ජන සංගනනය. මේ සංගනයේදී ගුවන් විදුලිය බැලුවා මොන සංක්‍රමනිකයන් ද ඕස්ට්‍රේලියාවේ වැඩිවෙලා තියෙන්නේ කියලා. මෙහිදි ශ්‍රී ලාංකික ප්‍රජාව වැඩි වරප්‍රසාදයක් ලැබුණා.

අපේ ප්‍රජාවගේ වැඩි පිරිසක් ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වී ඇති නිසා... මෙතෙක් තිබුන පැයක විකාශන කාලය වැඩි කරන්නේ. ඒ අනුව තමයි අපට පැය 4-6 ක කාලයක් ලැබුනේ ඒ අනුව තමයි සඳුදා, අගහරුවාද බ්‍රහස්පතින්දා සහ සිකුරාදා උදේ 11 සිට 12 දක්වා කාලයක් අපට ලැබුනේ ඔවුන්ගේ අරමුණ තමයි වැඩි ගුවන් කාලයක් හරහා සිංහල ප්‍රජාව අමතන්න.

**ශ්‍රීනාත් -**
මේ විකාශන කාලය අනුව වැඩසටහන් පෙළගැහෙන්නේ මොන ආකාරයටද?




**දිල්රුක්ෂි**
කලින් තිබුන ආකාරයට වඩා හැම වැඩසටහනකම ක්‍රම වේදය වෙනස් කරලා තියෙනවා. ගීත විකාශනය කලා, මවුබිමේ විස්තර ඉදිරිපත් කලා මේ වගේ වැඩසටහන් කලින් ඉදිරිපත් කලේ.

ඉතින් පාලන අධිකාරිය තේරුම් ගෙන වැඩසටහන් සවන් දෙන බොහෝ අය දැන ගන්නේ තමන්ගේ මවුබිමේ සිදුවන විස්තර විතරයි. මද වශයෙන් තමයි ඕස්ට්‍රේලියාවෙ සිදුවන දේ දැනගන්නේ කියලා. ඒ නිසා වැඩ සටහනේ 70% ක් ඕස්ට්‍රේලියාවේ සිදුවන දේවල් කතා කරන්න ඕනේ 30% තමන්ගේ මවුබිමේ වෙන දේවල් කතා කරන්න ඕනේ. මේ අනුපාතය අනුව තමයි වැඩසටහන් පෙළ ගැහෙන්නේ.

මම මුලින්ම වැඩසටහන අතට ගන්න කොට මෙහි මැතිවරණ ව්‍යාපාරය ආරම්භ වෙලා තිබුනේ. ඒ වෙලාවේදි මට තේරුනා අපේ හුගක් ප්‍රජාවේ අය මෙහි සිදුවන දෑ තීන්දු කරන ආර්ථික සමාජ වෙනස්කම් ගැන වැඩි අවබෝධයකින් නෑ කියලා. මේ වගේ ආන්ඩු වෙනස් වෙනකොට මොනවාද තින්දු තීරණ වෙනස් වෙන්නේ කියල දේශපාලන තීරණ අපේ කොමිනිටි එකට බලපාන්නේ කෙහොමද කියලා, වැඩි අවබෝධයක් නෑ.... ඒ අනුව මේ හැම දෙයක්ම වැඩසටහනකම පෙළ ගැස්සුවම දේශපාලන තත්ව, ආර්ථික බලපෑම, ආගමන විගමන ප්‍රශ්න නිවාස හා බැංකු පිළිබඳ මම ප්‍රජාව දැනුවත් කළා. ඒ වගේම පළමු වතාවට මෙහි ඉන්න දේශපාලකයින්, ආර්ථික විශේශඥයින් මැදිරයට ගෙනැල්ලා ඔවුන් සමග සාකච්ඡා පැවැත්වුවා. ඒ වගේම ඔවුන් ගත්ත තීන්දු තීරන අපේ ප්‍රජාවට බලපාන්නේ කෙහොමද කියලා කෙලින්ම ප්‍රශ්න කලා...

ඒ අතරම මම පටන් ගන්න කොට මට තේරුනා SBS ගුවන් විදුලිය ප්‍රාන්ත කීපයකට සීමාවෙලා තිබුනා කියලා... මම එය වෙනස් කරලා හැම ප්‍රාන්තයකටම පුළුල් කලා . ඒ ඒ ප්‍රාන්ත වලින් මෙහි සේවයට ශිල්පින් බඳවා ගත්තා. ඒ එක්කම හැම ප්‍රාන්තයකට තිබෙන අපේ ගුවන් විදුලිය කියන එක අඟවන්න උත්සාහ කළා. ඒ එක්කම

